# සිඟිති බාලදක්ෂ වැඩසටහන

## ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

සිඟිති බාලදක්ෂ හා වැඩ සටහන් අංශයේ ප්‍රකාශනයකි

# සිඟිති බාලදක්ෂ වැඩසටහන

ප්‍රථම මුද්‍රණය - 2021

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
65/9, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
කොළඹ 02

පිටු සැකසීම සහ ගැෆික් නිර්මාණය -
එච්. චාමර සඳරුවන් කල්දේරා
සහය මූලස්ථාන කොමසාරිස්

# සිඟිති බාලදක්ෂ වැඩසටහන

# SINGITHI SCOUT PROGRAM

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கை சாரணர் சங்கம்
Sri Lanka Scout Association

# පටුන


| අන්තර්ගතය | පටුන |
|---|---|
| 01 මෙහෙවර ප්‍රකාශය | 1 |
| 02 සිඟිති බාලදක්ෂ අංශයේ අධ්‍යාපනික අරමුණු පරමාර්ථ | 2 |
| 03 සිඟිති බාලදක්ෂ පොරොන්දුව, නීතිය හා ආදර්ශ පාඨය | 3 |
| 04 සිඟිති බාලදක්ෂ තේමා ගීතය | 4 |
| 05 සිඟිති බාලදක්ෂ අංශය | 5 |
| 06 සිඟිති පොකුරු සඳහා භාවිතා වන මල් | 6 |
| 07 සිඟිති බාලදක්ෂ ගොමුව | 7 |
| 08 සිඟිති බාලදක්ෂ වැඩසටහනෙහි සාරාංශය | 8 - 10 |
| 09 සිඟිති බාලදක්ෂ සාමාජික පදක්කමේ අවශ්‍යතා | 11 - 12 |
| 10 සිඟිති බාලදක්ෂ සතුට පදක්කමේ අවශ්‍යතා වගුව | 13 |
| 11 සිඟිති බාලදක්ෂ සතුට පදක්කමේ අවශ්‍යතා | 14 - 17 |
| 12 සිඟිති බාලදක්ෂ දිනුම පදක්කමේ අවශ්‍යතා වගුව | 18 |
| 13 සිඟිති බාලදක්ෂ දිනුම පදක්කමේ අවශ්‍යතා | 19 - 23 |
| 14 සිඟිති බාලදක්ෂ නිළ ඇඳුම | 24 - 26 |
| 15 සිඟිති බාලදක්ෂ ප්‍රගති පත්‍රිකාව | 27 |
| 16 පෝතක බාලදක්ෂ පොරොන්දුව, නීතිය | 28 |

## මෙහෙවර ප්‍රකාශය

ස්වයං පරිසමාප්ත පුද්ගලයන් වශයෙන් සමාජයට ඵලදායී කාර්ය භාරයක් ඉටු කරමින් වඩාත් යහපත් ලොවක් ගොඩ නැගීම සඳහා සහයවීමට, බාලදක්ෂ පොරොන්දුව හා නීතිය මත පදනම් වූ පිළිගත් හර පද්ධතියක් මගින් ළමා හා තරුණ අධ්‍යාපනයට දායක වීම බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවරයි

## சாரணர் பணிக் கூற்று

சாரணர்களின் பணிக் கூற்றானது இளைஞர்களின் கல்விக்கு, சாரணர் வாக்குறுதி மற்றும் சாரணர் விதிகளை அடிப்படையாகக் கொண்ட ஒரு மதிப்பு மிக்க அமைப்பு மூலம், மக்கள் தனிநபர்களாக சுய பூரணத்துவமாக ஒரு சிறந்த உலகத்தை உருவாக்க உதவுவதோடு சமூகத்தில் ஆக்கபூர்வமான பங்கைக் கொண்டுள்ளது.

## Mission of Scouting

The mission of Scouting is to contribute to the education of young people, through a value system based on Scout Promise and Scout Law, to help build a better world where people are self-fulfilled as individuals and play a constructive role in society.

# සිඟිති බාලදක්ෂ අංශයේ අරමුණු හා අධ්‍යාපන පරමාර්ථ

## අධ්‍යාපන අරමුණු

★ ශ්‍රී ලංකාවේ කුඩාම දරුවන් තුළ බාලදක්ෂ ව්‍යාපාරය පිළිබඳ රුචිකත්වය ඇති කිරීම.

★ ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ආරම්භයේ සිටම බාලදක්ෂ ව්‍යාපාරයට සාමාජිකයින් ඇතුළත් කර ගත හැකි වීම.

★ දරුවාගේ මුල් අවදිය තුළ නිපුණතා ඇති කරවීමට රුකුලක් වීම.

★ අර්ථවත් ලෙස සොබාදහම රස විඳිමට පෙළඹ වීම.

★ සරළ ක්‍රියාකාරකම් තුළින් අන් අයට උදව් කිරීම සහ එයින් සතුටු වීම.

## අධ්‍යාපන පරමාර්ථ

| අධ්‍යාපන අරමුණු | පරමාර්ථ |
|---|---|
| ශාරීරික (Physical) | සෞඛ්‍ය සම්පන්නව සිටීමට අවශ්‍ය වන යහපත් සෞඛ්‍ය පුරුදු සරල විනෝදාත්මක ක්‍රියාකාරකම් මගින් අවබෝධ කර ගනියි |
| බුද්ධිමය (Interlectual) | විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අනාගත ආයෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණයට දැනුම ලබා ගැනීම පිණිස විනෝදමත්ව කුතුහලයෙන් යුතු සරල ක්‍රියාකාරකම් මගින් අවස්ථා සලසා ගනියි. |
| චිත්තවේගී (Emotional) | සමීප සබඳතාවයන්ගේ පැවැත්ම ගෞරවනීය ලෙස ආරක්ෂා කිරීමට අවශ්‍ය පුහුණුව විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් හඳුනා ගනියි. |
| සමාජයීය (Social) | සමාජ සාරධර්ම පිළිබඳ ප්‍රාථමික දැනුම විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් හඳුනා ගනියි. |
| අධ්‍යාත්මික (Spiritual) | නිර්මාණශීලී ක්‍රියාකාරකම් මගින් ආගමික හර පද්ධතීන් පිළිබඳව සරලව අවබෝධ කර ගනියි. |
| සංස්කෘතික (Cultural) | සමාජ පැවැත්මට පාදක වන සංස්කෘතික අංගයන් පිළිබඳව සුමටව විනෝදාත්මකව සරල ක්‍රියාකාරකම් මගින් හඳුනා ගනියි |

**සිඟිති බාලදක්ෂ පොරොන්දුව**
சிங்கிதி சாரணர் வாக்குறுதி
**SINGITHI SCOUT PROMISE**

"මාගේ ආගමට හා රටට
මම ආදරය කරමි."

நான் எனது மதத்தையும்
நாட்டையும் நேசிக்கிறேன்

**I love my religion
and country**

# සිඟිති බාලදක්ෂ නීතිය
# சிங்கிதி சாரணர் விதி
# SINGITHI SCOUT LAW

**01**
සිඟිති බාලදක්ෂයා වැඩිහිටියන්ට කීකරු වෙයි.
சிங்கிதி சாரணர் பெரியவர்களுக்கு கீழ்ப்படிகிறார்
**Singithi Scout obeys adults**

**02**
සිඟිති බාලදක්ෂයා සතුටින් සිටින්නෙකි.
சிங்கிதி சாரணர் மகிழ்ச்சியாக இருக்கிறார்
**Singithi Scout is joyful**

**සිඟිති ආදර්ශ පාඨය - "යාළුකමයි සතුටයි"**
சிங்கிதி சாரணர் குறிக்கோள் - நட்பு மற்றும் மகிழ்ச்சி
Singithi Scout Motto - Friendship and Happiness

# සිඟිති බාලදක්ෂ තේමා ගීතය



පුංචි පුංචි පුංචි අපි හෙට ලොකු වෙනවා
යාළු යාළු යාළු අපි ලඟින් ඉන්නවා
මල් පොකුරක් වාගේ පිපී සුවඳ හමනවා
යාළුකමයි සතුට අපේ සිනා ගලනවා

# සිඟිති බාලදක්ෂ අංශය

**බාලදක්ෂ සමූහයේ අවුරුදු 05 ත් 07 ත් අතර දරුවන් සඳහා ඇති බාලදක්ෂ ඒකකය සිඟිති බාලදක්ෂ ගොමුව” නමින් හඳුන්වනු ලබයි. එක් කණ්ඩායමක සිටිය හැකි සිඟිති බාලදක්ෂයින්ගේ උපරිම සංඛ්‍යාව 40 කි. සිඟිති ගොමුව කුඩා කොටස් වශයෙන් බෙදනු ලබන අතර එම කුඩා ඒකකය මල් පොකුර” වශයෙන් හඳුන්වනු ලබයි. එසේ නම් කරනු ලබන පොකුරක සිටිය හැකි සිඟිති බාලදක්ෂයින් සංඛ්‍යාව 08 ත් 10 ත් අතර වේ. ඒ සඳහා යෝජිත මල් වර්ග හා වර්ණයන් පහත දැක්වේ.**

## මල් වර්ග හා වර්ණයන්

| | | මල් වර්ගය | වර්ණය | සිටිය යුතු සිඟිති බාලදක්ෂ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | 1 - 1 | ඉද්ද | සුදු | 08 - 10 |
| | 1 - 2 | අරලිය | | |
| | 1 - 3 | පිච්ච | | |
| 2 | 2 - 1 | ඇන්තූරියම් | රතු | 08 - 10 |
| | 2 - 2 | එරබදු | | |
| | 2 - 3 | මහරත් | | |
| 3 | 3 - 1 | රුක් අත්තන | කහ | 08 - 10 |
| | 3 - 2 | ඇහැල | | |
| | 3 - 3 | කපුරු | | |
| 4 | 4 - 1 | මානෙල් | නිල් | 08 - 10 |
| | 4 - 2 | කටරොළු | | |
| | 4 - 3 | බිනර | | |
| 5 | 5 - 1 | උඩවැඩියා | තැඹිලි | 08 - 10 |
| | 5 - 2 | දාස්පෙතියා | | |
| | 5 - 3 | අටපෙතියා | | |

# සිඟිති බාලදක්ෂ සඳහා භාවිතා වන මල් පොකුරු


ඉද්ද


අරලිය


පිච්ච


ඇන්තූරියම්


එරබදු


මහරත්


රුක්අත්තන


ඇහැළ


කපුරු


නිල්මානෙල්


නිල් කටරොළු


බිනර


උඩවැඩියා


දාස්පෙතියා


අටපෙතියා

# සිඟිති බාලදක්ෂ ගොමුව

**1 සිඟිති බාලදක්ෂ ගොමුවක සංඛ්‍යාව - 40 කි.**

**2 සිඟිති බාලදක්ෂ අංශයේ වර්ණය - ලා නිල්**

**3 සිඟිති බාලදක්ෂ ගොමුවක මල් පොකුරු ප්‍රමාණය - 05 (කුඩා ඒකක)**

**4 සිඟිති බාලදක්ෂ ගොමුව මෙහෙයවීම - සිඟිති බාලදක්ෂ නායක/නායිකා**

**5 සිඟිති බාලදක්ෂ ගොමුව මෙහෙයවීමට සහය - සහය සිඟිති බාලදක්ෂ නායක/නායිකා**

**6 සිඟිති බාලදක්ෂ අංශයේ ආදර්ශ පාඨය - යාළුකමයි සතුටයි**

## සිඟිති බාලදක්ෂ කොඩිය



# සිඟිති බාලදක්ෂ වැඩසටහනෙහි සාරාංශය

## සාමාජික පදක්කම

| | ප්‍රදානය | සේවා කාලය | නියමිත රැස්වීම් ගණන | සහභාගී වියයුතු අවම රැස්වීම් සංඛ්‍යාව | ඉටු කළ යුතු කාර්යය |
|---|---|---|---|---|---|
| **07 - 1** | ජාතික සාමාජික පදක්කම | මාස 01 යි | 03 | 03 | ක්‍රියාකාරකම් 05 යි<br>i. බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘවරයාගේ නම<br>ii. ආචාර කිරීම (Salute)<br>iii. වමතින් අතට අත දීම<br>iv. සිඟිති බාලදක්ෂ පොරොන්දුව හා නීතිය<br>v. සිඟිති බාලදක්ෂ ආදර්ශ පාඨය<br>"යාළුකමයි සතුටයි" |

# සතුට පදක්කම

| | ප්‍රදානය | සේවා කාලය | නියමිත රැස්වීම් ගණන | සහභාගී වියයුතු අවම රැස්වීම් සංඛ්‍යාව | ඉටු කළ යුතු කාර්යය | |
|---|---|---|---|---|---|---|
| 07 - 1 | ෂතුට පදක්කම | මාස 5 යි | 20 | 15 | සිගිති ලොව | • සිගිති පැල<br>• සිගිති කඩමණ්ඩිය<br>• සිගිති කෙළිබිම<br>• සිගිති හපන් බිම<br>• සිගිති දැක්ම |
|  | | | | | පරිසර මුසුව | • ප්‍රියජනක චාරිකා<br>• මී අඹ සෙවන<br>• වෙලක මහිම<br>• මුහුදු වෙරළ/වැව් පිටිය<br>• මල් උයන |
| | | | | | මනල උයන | • මල් ගොමුව<br>• සිතුවම් රටා<br>• ගීත මඩල<br>• සරුංගල් පිටිය<br>• කුසලතා මඟ |
| | | | | | පිලේ පැදුර | • රජ කථාන්දර<br>• ගැමි කථාන්දර<br>• ආදර්ශ කථාන්දර<br>• උපමා කථාන්දර<br>• ආගමික කථාන්දර |

# දිනුම පදක්කම

| | ප්‍රදානය | සේවා කාලය | නියමිත රැස්වීම් ගණන | සහභාගී වියයුතු අවම රැස්වීම් සංඛ්‍යාව | ඉටු කළ යුතු කාර්යය | |
|---|---|---|---|---|---|---|
| 07 - 1 | දිනුම පදක්කම | මාස 7 යි | 25 | 20 | ගැමි සුවඳ | • ජන ගායනා<br>• ජන මූල ක්‍රීඩා<br>• ගැමි ගෙදර<br>• සංග්‍රහය<br>• සාජ්ජය<br>• කමත/දොළ ළඟ |
|  | | | | | හැඩගැස්ම | • ආගමික නැඹුරුව<br>• සිගිති පෙරහැර<br>• වැඩිහිටි ගරු කිරීම<br>• යහපත් පුරුදු<br>• පිරිසිදුකම හා පැවැත්ම |
| | | | | | සතුටු සේවය | • අනුනට උදව් කිරීම<br>• පන්ති කාමරය පිරිසිදු කිරීම<br>• ගුරුවරුන්ට කීකරු වීම හා සැලකීම<br>• දෙමාපියන්ට කීකරු වීම.<br>• පාසල් මිතුරන්ට ආදරය කිරීම |
| | | | | | දැනුම් පහන | • අවබෝධය<br>• සරල දැනුම මිනුම තරග<br>• ප්‍රායෝගික ක්‍රියාකාරකම් ක්‍රියාවෙන් අවබෝධය<br>• සමාජ හුරුව තුළින් දැනුම |
| | | | | | හැකියා පුබුදුව | • අත්කම්<br>• රංගන කුසලතා<br>• නිර්මාණශීලීබව<br>• හසුරු කෞෂලයය<br>• ප්‍රායෝගික සරල අභ්‍යාස |

# සිඟිති බාලදක්ෂ සාමාජික පදක්කමේ අවශ්‍යතා

I. **බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘවරයාගේ නම**

II. **ආචාර කිරීම** (Salute)

III. **වමතින් අතට අත දීම**

IV. **සිඟිති බාලදක්ෂ පොරොන්දුව හා නීතිය**

V. **සිඟිති බාලදක්ෂ ආදර්ශ පාඨය**



## බේඩ්න් පවෙල් සාමි තුමා



ආචාර කිරීම



වමතින් අතට අත දීම

## සිඟිති බාලදක්ෂ පොරොන්දුව

මාගේ ආගමට හා රටට මම ආදරය කරමි."

## සිඟිති බාලදක්ෂ නීතිය

1. සිඟිති බාලදක්ෂයා වැඩිහිටියන්ට කීකරු වෙයි.
2. සිඟිති බාලදක්ෂයා සතුටින් සිටින්නෙකි.

## ආදර්ශ පාඨය

"යාළුකමයි සතුටයි"

# සතුට පදක්කමේ අවශ්‍යතා

**පහත සඳහන් ප්‍රධාන මාතෘකා හතර යටතේ නිර්දේශිත අවශ්‍යතාවයන්ගෙන් අවම වශයෙන් එක් කොටසකින් 3 බැගින් රැස්වීම් 15 සඳහා ක්‍රියාකාරකම් මාතෘකා තෝරා ගත යුතුය. අනෙකුත් ක්‍රියාකාරකම් මාතෘකා රිසි පරිදි තෝරා ගන්න**

| | | |
|---|---|---|
| I | සිඟිති ලොව | • සිඟිති පැල<br>• සිඟිති කඩමණ්ඩිය<br>• සිඟිති කෙළිබිම<br>• සිඟිති හපන් බිම<br>• සිඟිති දැක්ම |
| II | පරිසර මුසුව | • ප්‍රියජනක චාරිකා<br>• මී අඹ සෙවන<br>• වෙලක මහිම<br>• මුහුදු වෙරළ/වැව් පිටිය<br>• මල් උයන |
| III | මනල උයන | • මල් ගොමුව<br>• සිතුවම් රටා<br>• ගීත මඩල<br>• සරුංගල් පිටිය<br>• කුසලතා මඟ |
| IV | පිලේ පැදුර | • රජ කථාන්දර<br>• ගැමි කථාන්දර<br>• ආදර්ශ කථාන්දර<br>• උපමා කථාන්දර<br>• ආගමික කථාන්දර |

## සතුට පදක්කමේ නිර්දේශිත අවශ්‍යතා සැකෙවින්

# I. සිඟිති ලොව

### 1. සිඟිති පැල

පොල් අතු, කොළ අතු වැනි ස්වාභාවික ද්‍රව්‍ය උපයෝගී කරගෙන කුඩා පැලක් සැකසීම. ඒ ආශ්‍රිතව සෙල්ලම් ගෙදර තුල, අතුරු මිතුරු, කෝම් පිට්ටු, සෙල්ලම් බත් ඉවීම වැනි ක්‍රියාකාරකම් වල නිරත කරවීම.

### 2. සිඟිති කඩමණ්ඩිය

දෙමාපියන් හා සම්පත්ධාරීන් ගේ සහය ලබා විවිධ භාණ්ඩ රැස් කර එම භාණ්ඩ විකිණීමේ පොළ භූමියක් සැකසීම. ගුරුවරු සම්පත්ධාරීන් හෝ දෙමාපියන් දරුවන් සමග පොළට ගොස් බඩු මිලදී ගැනිම වැනි ක්‍රියාකාරකම් වල නිරත කරවීම.

### 3. සිඟිති කෙළිබිම

වැඩිහිටි සම්පත් ධාරීන්ගේ සහය ඇතිව සරල ජන ක්‍රීඩා කිහිපයක්, එනම් කොපර කොපර පිපිඤ්ඤා, සාර සදිසි පෙති, එළුවන් කෑම වැනි ක්‍රීඩා කීහිපයක් යොදා ගත හැකි ය. ක්‍රීඩා වලට අදාල ගීතයන්ද යොදා ගන්න.

### 4. සිඟිති හපන්බිම

සිඟිත්තන් කැමති චරිත නිරූපණය සඳහා ඔවුන් යොමු කිරීම.

උදා : ගුරුවරියගේ, මවකගේ යාචකයකුගේ වැනි චරිත.

### 5. සිඟිති දැක්ම

විවිධ අවස්ථා හඳුන්වා දී ඒ ඇසුරින් නිර්මාණශීලිව සරල සංවාද පැවැත්වීම. මෙය රංගන ස්වරූපයෙන් ද පැවැත්විය හැකිය.

උදා : අම්මා ගැන, තාත්තා ගැන, අනාගත බලාපොරොත්තු, දෙමාපියන්ට සැලකම, වැඩිහිටියන්ට සැලකීම, ආගමානුකූල පිළිවෙත්, චාරිත්‍රවාරිත්‍ර

# II. පරිසර මුසුව

## 1. ප්‍රිය ජනක චාරිකා

ඇලක් ලඟට හෝ දොළක් ලඟට ළමුන් රැගෙන ගොස් එහි අසිරිය විඳීමට ඔවුන් යොමු කළ හැකි ය. ඒ ආශ්‍රිත කතාන්දර, ගීත, රංගනයන්, චිත්‍ර ඇඳීම ආදියට අවකාශ සැලසීම. ප්‍රියජනක අයුරින් සංග්‍රහ සංවිධානය කිරීම.

## 2. මී අඹ සෙවන

මල් හා ගෙඩි වලින් පිරුණු පලතුරු ගසක් යට හමුවක් පැවැත්වීම. එහිදී පලතුරු කෑමෙහි අගය කියා දී පලතුරු අනුභවය සඳහා ඔවුන් දිරිමත් කළ හැකි ය. සිඟිති බාලදක්ෂ දරුවන් ආකර්ශනීය අයුරින් තෘප්තිමත් කර අනාගත ආයෝජනය සඳහා මතයක් සිත් තුල තහවුරු කිරීම සිදු විය යුතුය.

## 3. වෙලක මහිම

වී කරල් වලින් පිරුණු වෙල් යායක්, පුරන් වූ කුඹුරක් හෝ පුරන් කෙටූ කුඹුරක චමත්කාරය නැරඹීමට අවස්ථාව ලබා දීම. මෙහිදී අප ආහාරයට ගන්නා බත පිළිබඳ සංවාදයක් ඇති කළ හැකිය පරිසරයේ අරුමය කෙතරම් අගේ ද යන්න සිත් තුලට ඇතුලත් විමට සුදුසු වැඩසටහනක් සංවිධානය කරන්න. ගොයම් කවි වැනි අදාල ජන ගී ගායනා කරන්න.

## 4. මුහුදු වෙරළ/වැව් පිටිය

මුහුදු වෙරළකට හෝ වැව් පිටියකට ආරක්‍ෂා සහිතව (දෙමාපියන් සමඟ) ළමුන් රැගෙන යෑම. ඒ ඒ අවස්ථාවට උචිත වන පරිදි සුදුසු නිර්මාණශීලි ක්‍රියාකාරකම් වල යෙදවීම. වැව් පිටියක නම් වැදගත්කම පිළිබඳව ද අවබෝධයට ඉඩ සලසන්න.

## 5. මල් උයන

මල් වත්තක් නැරඹීමට ළමුන් රැගෙන යෑම. ඒ අනුව මල් වත්තක් චිත්‍රයට නැගීමට යොමු කළ හැකිය. එහි ඇති අලංකාරය, එහි ඇති සුවඳ හේතුවෙන් පරිසරය තුල ඇතිවන ප්‍රබෝධය මල් වත්තට එකතු වන කුඩා මිතුරන් හා එහි සමීපතාවය. මල් වත්තක සිටින යහළුවන් නිසා එහි ඇතිවන අලංකාරය.

# III. සමනල උයන

## 1. මල් ගොමුව

සිඟිත්තෝ තමන්ගේ මල් පොකුරට අදාල මලින් සැරසී රංගනයක යෙදීම. මල් ගැන ගීත ගයා ඔවුන් සතුටට පත් කිරීම. එයට සුදුසුම පරිසරය තෝරා ගත යුතුය. තරඟකාරීව වැඩසටහන ක්‍රියාත්මක කරන්න.

## 2. සිතුවම් රටා

නිදහසේ තමන් කැමති චිත්‍රයක් ඇඳීමට සලස්වා ඒවා සඳහා සුදුසු මාතෘකා ඔවුන් සමග සාකච්ඡා කර සැපයීම. මෙය තරඟයක් ලෙස ද පැවැත් විය හැකි ය. ජයග්‍රහණය සඳහා ඇගයීමක් ද කළ හැකි ය. සිතුවම් රටා මැවීමට විවිධ ක්‍රම උපයෝගී කර ගන්න. පැස්ටල්, ටියුබ් කලස්, දිය සායම්, අඟුරු, ස්වාභාවික ද්‍රව්‍ය ආදිය ප්‍රයෝජනයට ගන්න. වියලි කොළ වර්ග වලින් ද සිතුවම් රටා මැවිය හැකිය.

## 3. ගීත මඬල

සමනල උයන සඳහා තෝරා ගෙන ඇති ගීත කීහිපයක් (උදා : උදෑසනම පොඩි අපි, මගේ පොඩි යාලු, මට මැණී වගේ තවගග ) සිඟිත්තන් සමඟ නිවැරදි තාලයට ගයමින් ගායනයට හුරු කිරීම. රංගනයට ඉඩ දෙන්න. ශබ්ද විකාශන යන්ත්‍ර සි.ඩී යන්ත්‍ර භාවිතය වැඩසටහනේ උනන්දුව හා විනෝදය වඩාත් තීව්‍ර කරණු ඇත. ගීතයට අනුව නිර්මාණශීලිව රංගනය කිරීමට ස්වයංව ඉඩ දෙන්න.

## 4. සරුංගල් පිටිය

මල් පොකුරු වශයෙන් වැඩිහිටි සහය ඇතිව සරුංගල් සෑදීම, මල් පොකුරු වශයෙන් සරුංගල් ඉහළ යැවීමට සහය ලබා දීම. සරුංගල් නිර්මාණය කිරීම සඳහා උනන්දු කරන්න. සමබරතාවය හා එහි වැදගත්කම ළමා කතන්දර ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. වැඩිහිටි සහය උපරිමයෙන් ලබා ගන්න.

## 5. කුසලතා මග

පොල් කොළ, ගොක් කොළ, කොස් කොළ වැනි ස්වාභාවික ද්‍රව්‍ය වලින් (උදා : කොස් කොළ තොප්පිය) වැනි කුඩා නිර්මාණ ළමුන් ලවා කරවීම. මෙම නිර්මාණ අගය කර ත්‍යාග පිරිනමන්න. රුක් කලාවන් හඳුනා ගනිමින් නිර්මාණයට ආචාර්යවරුන් ගේ සහය මත ඉඩ දෙන්න. කෙසෙල්පට්ටා, කුඩා ගස්වැල්, උපයෝගී කර ගනිමින් ලණුවක් ඇඹරීම. එවැනි ක්‍රියාකාරකම් නිර්මාණශීලිව යොදා ගන්න.

# IV. පිලේ පැදුර

## 1. රජ කතාන්දර

වැඩිහිටියෙකු අන්දරේ ලෙස සැරසි සිඟිත්තන් ගේ සිත්ගන්නා අයුරින් කථාන්දර කිව හැකි ය. ළමුන්ව බිම හිඳුවා (පහසු ලෙස) කථාන්දර ඇසීමට සැලැස්විය හැකිය

## 2. ගැමි කතාන්දර

මහදැන මුත්තාගේ කථාන්දර වැනි ගැමි කතා ඉදිරිපත් කළ හැකි ය.

## 3. ආදර්ශ කතාන්දර

මද්දුම බණ්ඩාර කතාව වැනි ආදර්ශ කතන්දර කියා දීම හෝ රංගනය.

## 4. උපමා කතාන්දර

පුහුල් හොරා කරින් දැනේ වැනි කතා කීම.

## 5. ආගමික කතාන්දර

බෞද්ධ ජාතක කතා වැනි ඒ ඒ ආගම් වලට අදාල සරල කතාන්දර කියා දීම.

මෙම කතාන්දර පොත් පත්, සඟරා මගින් රූපවාහිනි මාධ්‍යයෙන් මෙන්ම වැඩිහිටියන්ගෙන්ද සොයා ගත හැකිවේ. ඒවා සිත් ගන්නා අයුරින් ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරිම ඉතා වැදගත්ය. කතාන්දර ඉදිරිපත් කිරීමට දක්ෂතාවයක් ඇති සම්පත්ධාරීන්ගේ සහය උපරිමයෙන් ලබා ගන්න.

# දිනුම පදක්කමේ අවශ්‍යතා

**පහත සඳහන් ප්‍රධාන මාතෘකා පහ යටතේ නිර්දේශිත අවශ්‍යතාවයන්ගෙන් අවම වශයෙන් එක් කොටසකින් 03 බැගින් රැස්වීම් 20 සඳහා ක්‍රියාකාරකම් මාතෘකා තෝරා ගත යුතු ය. අනෙකුත් ක්‍රියාකාරකම් මාතෘකා රිසි පරිදි තෝරා ගන්න.**

| | | |
|---|---|---|
| I | ගැමි සුවඳ | • ජන ගායනා<br>• ජන මුල ක්‍රීඩා<br>• ගැමි ගෙදර<br>• සංග්‍රහය<br>• සාජ්ජය<br>• කමත/දොළ ළග |
| II | හැඩ ගැස්ම | • ආගමික නැඹුරුව<br>• සිඟිති පෙරහැර<br>• වැඩිහිටි ගරු කිරීම<br>• යහපත් පුරුදු<br>• පිරිසිදුකම හා පැවැත්ම |
| III | සතුටු සේවය | • අනුනට උදව් කිරීම<br>• පන්ති කාමරය පිරිසිදු කිරීම<br>• ගුරුවරුන්ට කීකරු වීම හා සැලකීම<br>• දෙමාපියන්ට කීකරු වීම.<br>• පාසල් මිතුරන්ට ආදරය කිරීම |
| IV | දැනුම් පහන | • අවබෝධය<br>• සරල දැනුම මිනුම තරග<br>• ප්‍රායෝගික ක්‍රියාකාරකම් ක්‍රියාවෙන් අවබෝධය<br>• සමාජ හුරුව තුළින් දැනුම |
| V | හැකියා පුබුදුව | • අත්කම්<br>• රංගන කුසලතා<br>• නිර්මාණශීලීබව<br>• හසුරු කෞෂල්‍යය<br>• ප්‍රායෝගික සරල අභ්‍යාස |

# දිනුම පදක්කමේ නිර්දේශිත අවශ්‍යතා සැකෙවින්

## I. ගැමි සුවඳ

**1. ජන ගායනා**

ආචාර්යවරයා විසින් ජන ගී එකතුවක් සකස් කරගෙන ඉන් කීහිපයක් නිවැරදි තාල වලට ගායනා කිරීමට ළමුන් පුහුණු කිරීම හා ඔවුන් සමග ගායනා කිරීම.

(උදා : කරත්ත කවි, පාරු කවි) මේ සඳහා සුදුසු සම්පත් ධාරීන් ගේ සහය උපරිමයෙන් ලබා ගන්න. රංගනයන්ට ද උපරිම අවස්ථාව ලබා දෙන්න.

**2. ජන මූල ක්‍රීඩා**

පුවත්පත් /සඟරා/වීඩියෝ දර්ශන යොදා ගනිමින් අපේ ජන ක්‍රීඩා පිළිඳව සරල අවබෝධයක් ලබා දීම.

(උදා : එළුවන් කෑම, ඔළිද කෙළිය, කොපර කොපර පිපිඤ්ඤා) වඩා හොඳින්ම පෙර සූදානම තිබිය යුතුය. නොවරදවාම අගයන්න. ත්‍යාග ප්‍රදානය කරන්න.

**3. ගැමි ගෙදර සංග්‍රහය**

ගැමි ගෙයක්, එහි ගැමි ගෙදරක සිදුවීම් නිරූපණය කිරීම කළ හැකිය. සම්ප්‍රදායික ආහාර පාන (කැවුම් කොකිස්, අතිරස ආදී ) පිළියෙල කරන්න. සුදුසු ඇඳුම් ආයිත්තම් වලින් සැරසීමට ඉඩ දෙන්න.

**4. සාජ්ජය**

උණ කොටල බෙර, පොල් කටු, සිඟිති බෙර වැනි ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් සාජ්ජයක් දැමිය හැකිය. මෙහිදී දරුවන්ට පැරණි ළමා ගීත ගැයීමට අවස්ථාවක් ලබා දීම සුදුසු ය. රංගනයේ ද යෙදීමෙන් උපරිම විනෝදය ලබාදීමට කටයුතු කරන්න.

**5. කමත/දොළ ලග**

පාසල පිහිටි ප්‍රදේශය අනුව කමතක් නැරඹීමට ළමුන් රැගෙන යා හැකි ය. (නැතිනම් දෘෂ්‍ය මාධ්‍ය ඔස්සේ කමතක ස්වභාවය පෙන්නුම් කළ හැකිය) මෙහිදි ගොවි මහතකු ද සිටී නම් වඩා වැදගත්ය. තවද කමතක සිදුවන දේ පිළිබඳ අවබෝධය ලබාදීම. කමත් වචන.

(උදා : වී හුළං කිරීම වැනි) කමතක් නොමැති නම් සුදුසු ස්ථානයක කමතක් නිර්මාණය කිරීම අවශ්‍යවේ. ස්වභාවධර්මයේ අසිරිය උපරිමයෙන් ලබා දීම මෙමගින් සිදු කළ හැකිය.

# II. හැඩ ගැස්ම

## 1. ආගමික නැඹුරුව

ආගමික නායකයකු පාසලට කැඳවා ගැනීමෙන් හෝ, ආගමික ස්ථානයකට දරුවන් කැටුව ගොස් ආගමික නායකයකු සමඟ වැඩ සටහනක් සංවිධානය කළ හැකිය. බෝධි පූජා පෙරහැර, සිල් ගත් අයට සැලකීම. බෝ මළුව පිරිසිදු වැනි ඒ ඒ ආගම් වලට අදාල ක්‍රියාකාරකම් දෙමව්පියන්ගේ සහාය ඇතිව සංවිධානය කළ හැකිය.

## 2. සිඟිති පෙරහැර

පාසලේ හෝ පිටත සිදුකරණ පෙරහැරකට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීමෙන් (උදා : කොඩි සෑදීම) සහය විය හැක. ළමුන්ව පෙරහැරකට සහභාගී කර විය හැකිය. මේ තුලින් සංස්කෘතික දැනුම පිළිබඳ අවබෝධය ලබා දිය යුතුය. උපරිමයෙන් දෙමව්පිය සහාය ලබා ගත යුතුය.

## 3. වැඩිහිටියන්ට ගරු කිරීම

සිඟිති දරුවන්ගේ දෙමාපියන් සඳහා හමුවක් සූදානම් කළ හැකිය. ඒ අවස්ථාවේ දී ළමුන්ගෙන් පුංචි නැටුමක් දෙකක් ඉදිරිපත් කළ හැකිය. සංග්‍රහ කටයුතු සඳහා ද ඔවුන් යොමු කළ හැකිය. සූදානම් කර තිබෙන සංග්‍රහයක් චාරිත්‍රානුකූලව පිරිනැමීම. වැඩිහිටියන්ට සැලකීම පිළිබඳ රචනා කරන ලද ගීත හා ඒ අනුව රංගන ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම.

## 4. යහපත් පුරුදු

යහපත් පුරුදු මොනවාදැයි යන්න ළමුන්ට පැහැදිළි කර දීම. (සමාවෙන්න, කරුණාකර .... වැනි වචන) අවශ්‍ය තැන් වලට මෙම වචන යෙදීම පැහැදිලි කිරීම. රෝග වලින් මිදීමට යහපත් පුරුදු බලපාන බව. එලෙසම නිවැරදි ලෙස බිම වාඩිවීම, පුටුව මත වාඩිවීම, සිටගෙන සිටීම පුරුදු කළ යුතුය.

## 5. පිරිසිදුකම හා පැවැත්ම

හෙද නිලධාරිණියක්, වෛද්‍යවරයෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතෙක් වැනි අයකු යොදා ගනිමින් පිරිසිදුකම පිළිබඳව ප්‍රායෝගික අවබෝධයක් ලබාදීම සිදු කළ හැකි ය. වසංගත රෝග බෝවෙන රෝග ආදී දෑ බෝවීම වලක්වා ගැනීමට පිරිසුදුකම බොහෝ සේ බලපාන බව. මේ පිළිබඳ කුඩා නාට්‍ය රචනා කර රග දැක්වීමට ඉඩ දෙන්න.

# III. සතුටු සේවා

**1. අනුන්ට උදව් කිරීම**

සතියකට එක් හොඳ වැඩක් චිත්‍රයකින් පෙන් විය හැකිය. ඒ සඳහා හොඳ වැඩ පොතක් පවත්වාගෙන යාමට උපදෙස් දීම, දරුවා හොඳ වැඩක් කළ විට පොතේ තරුවක් වැනි දෙයක් ලබා දිය හැකි ය. ළමා නිවාසයක හෝ වැඩිහිටි නිවාසයකට හෝ එවැනි ස්ථානයක ප්‍රබෝධමත් වැඩසටහනක් ආකර්ශනීය ලෙස ක්‍රියාත්මක කිරීම.

**2. පංති කාමරය පිරිසිදු කිරීම**

පංති කාමරයේ බිම කොළ කැබලි වැනි අනවශ්‍ය දෙයක් දුටු විට ඒවා අහුලා කුණු කූඩයට දැමීමට හුරු කිරීම කළ හැකි ය. එක් දිනක පංති කාමරය පිරිසිදු කිරීම හා නිවැරදි ක්‍රම උපයාගන්නා වටිනාකම් අවබෝධ වන පරිදි ක්‍රියාත්මක කිරීම. මේ සඳහා අමුත්තකු, විදුහල්පති හෝ ගුරුවරයකු කැඳවා ගන්න.

**3. ගුරුවරුන්ට කීකරුවීම හා සැලකීම**

ගුරුවරුන්ට ගරු කරන්නේ කෙසේද? කීකරු වීම කෙසේ විය යුතුද යන්න පිළිබඳව ළමුන් දැනුවත් කළ යුතුයි. ඔවුනට ඒ පිළිබඳව අවබෝධයක් ලබා දිය යුතුයි. විද්‍යාලයේ ගුරුභවතුන් කිහිප දෙනෙකුට ආරාධනා කර ඔවුන් හා චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරමින් විවිධ ක්‍රියාකාරකම් ආශ්‍රිත වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. ගුරු දිනය ප්‍රයෝජනයට ගන්න.

**4. දෙමාපියන්ට ගරු කිරීම හා කීකරු වීම**

දෙමාපියන්ගේ වටිනාකම හා ඔවුන් අගය කළ යුතු බවට ළමුන් දැනුවත් කළ යුතුයි. එලෙසෙම දෙමාපියන්ට කීකරු වීම හා ගරු කිරීමේ වැදගත් කම පහදා දිය යුතුයි. ගරු කරන්නේ කෙසේද යන්නද පහදා දිය යුතුයි. එක් දිනක් දෙමව්පියන් කැඳවා ගරුසරුව පිළිගෙන දෙමව්පියන්ට ගරු කිරීමේ හා කීකරුවීමේ වැදගත්කම ආකර්ශනීය විවිධ ක්‍රියාකාරකම් තුලින් දියත් කිරීම.

**5. පාසලේ මිතුරන්ට ආදරය කිරීම**

මිතුරන් සමඟ කෙසේ හැසිරිය යුතු ද යන්න ළමුන්ට පහදා දිය යුතුයි. ඔවුන් සමඟ රණ්ඩු නොකර ආදරයෙන් සිටිය යුතු බවට අවබෝධය ලබා දිය යුතුයි. පාසලේ හෝ සිඟිති බාලදක්ෂයන්ට සමීප මිතුරන් හා ඔවුන්ගේ වැඩිහිටියන් සමඟ රැස්වීමකට කැඳවා විවිධ විනෝදාත්මක ක්‍රියාකාරකම් උපයෝගී කරගනිමින් ආකර්ශනීය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

# IV. දැනුම් පහන

## 1. අවබෝධය

සිඟිත්තන් ගේ වයසට ගැලපෙන පරිදි සරල ගැටළු නිරාකරණයට අවස්ථාව සැලසීම. ගැලපෙන දේ තෝරා යා කිරීම්, නිවැරදි දේ තෝරා ඉරි ගැසීම් වැනි දේ කළ හැකිය. මෙය මල්පොකුරු ආශ්‍රිතව තරඟකාරීව පවත්වන්න. ගීත හා ක්‍රීඩා මගින්ද සිත් ගන්නා අයුරින් කරන්න.

## 2. සරල දැනුම මිනුම තරග

රූප ආශ්‍රිතව සතුන්, මල්, ලී බඩු වැනි දේ හඳුනා ගැනීමට අවස්ථාව ලබා දීම. සරල ප්‍රශ්ණ විචාරාත්මක තරග පවත්වන්න. සරල නිරීක්ෂණ ක්‍රීඩා ආදිය විනෝදාත්මක අයුරින් ක්‍රියාත්මක කරන්න.

## 3. ප්‍රායෝගික ක්‍රියාකාරකම්

සිඟිත්තන්ට සුදුසු ක්‍රීඩා කීහිපයක් තෝරා ගෙන ළමුන් අතර ක්‍රීඩා තරඟයක් පැවැත්වීම. සිඟිති බාලදක්ෂයන්ට ගැලපෙන සරල මාතෘකා අනුව දැනුම උද්දීපනය වන අයුරින් ක්‍රියාකාරකම් තෝරා ගන්න. කමත, මිනිරන් පතල, පැල සිටුවීම.

## 4. ක්‍රියාවෙන් අවබෝධය

ජාතික වීරවරයන් ගැන පළමුව ළමුන්ට අවබෝධය ලබා දිය යුතු ය. දෘෂ්‍යාධාර මඟින් එම චරිත පිළිබඳ දැනුම තහවුරු කිරීම. අනතුරුව චරිත රංගනයේ යෙදීම. (නිදසුන් :- මද්දුම බණ්ඩාර චරිතය)

එමෙන්ම පිරිසිදු මැටි වර්ග උපයෝගී කරගනිමින් විවිධ නිර්මාණ කිරීම.

## 5. සමාජ හුරුව තුලින් දැනුම

මාර්ග නීති පිළිබඳව සරලව ළමුන් දැනුවත් කිරීම. සංඥා පිළිබඳව ද (කොළ, රතු, කහ) දැනුවත් කර ක්‍රීඩාවක් මගින් වඩාත් අවබෝධය ලබා දීම. පොලිස් නිළධාරියකු රථවාහන හසුරුවන අවස්ථාවක් නැරඹීම. මාළු වෙළඳ පොළ හෝ එළවළු වෙළඳපොල නැරඹීම.

# V. හැකියා පුබුදුව

## 1. අත්කම්

සිඟිත්තන් ගේ එකතුව පැවැත්වෙන දින එක් ළමයකු එක් මලක් බැගින් වන සේ ගෙන්වා ගැනීම. ඒ මල් උපයෝගී කරමින් පොකුරකට එක් මල් පෝච්චියක් බැගින් ළමුන් හා එක්ව සැකසීම. මේ ආකාරයට පොකුරු සඳහා මල් සැරසිල්ලක් කිරීමට ද යොමු කළ හැකිය. කොස් කොළ තොප්පියක් සැදීම, කඩදාසියකින් හෝ ඉවත දමන දෑ වලින් මාල සැදීම.

## 2. රංගන කුසලතා

පාසලේ නැටුම් ගුරුවරියගේ සහයෝගයෙන් සිඟිති දරුවන්ට කළගෙඩි නැටුමක්, ලී කෙළි නැටුමක් ආදිය පුහුණු කළ හැකි ය. විවිධ අවස්ථා පිළිබඳ වාචිකව කියාදී රංගනයට ඉඩදීම, ගීත, කවි හා විරිදු ගායනා වලට අනුව ද රංගනයට ඉඩ සලසන්න.

## 3. නිර්මාණශිලී බව

ගස් වල මල් හා කොළ (සුදුසු පරිදි) පොත් තුල දමා වේලා ගැනීමට කලින් දැනුවත් කළ යුතුයි. ඒවා මගින් කාඩ්පතක් නිර්මාණයක් කර පෙන්වීම. ළමුන්ට එසේ සැකසීමට හුරු කිරීම. මල් පොකුරු ආශ්‍රිතව තරඟ කිරීම. චිත්‍ර රටා මෙන්ම විවිධ ද්‍රව්‍ය (කොළ,වැල්, කඩදාසි ආදී) දී නිර්මාණ සඳහා ඉඩ සලසන්න.


## 4. හසුරු කෞශලයය

මැටි,වැලි,ක්ලේ මගින් ආශ්‍රිත නිර්මාණ කිරීමට යොමු කිරීම. දෑත මෙන්ම අතැගිලි ක්‍රියාකාරී වන අයුරින් උපකරණ භාවිතා කිරීමට ඉඩ සැලසීම.


## 5. ප්‍රායෝගික සරල අභ්‍යාස

සැසදීම්, යාකිරීම්, ගැලපුම්, නොගැළපෙන දේ ඉවත් කිරීම. ආදී නිර්මාණය කළ අභ්‍යාස කලින් සාදා පැවරීම. පුවත්පත් සගරා ආදියෙන් සොයා ගත් මෙවැනි නිර්මාණ හෝ තමාම නිර්මාණය කළ අභ්‍යාස ද ලබා ගත හැකිය


# සිඟිති බාලදක්ෂ (බාලක/බාලිකා) නිලඇඳුම



# සිගිති බාලදක්ෂ බාලක නිලඇඳුම




# සිඟිති බාලදක්ෂ බාලිකා නිලඇඳුම






# සිඟිති බාලදක්ෂ ප්‍රගති පත්‍රිකාව



# ඉදිරියට මඟ........
## (වයස් සීමාව වයස අවුරුදු 7 - 11)

## පෝතක බාලදක්ෂ පොරොන්දුව

මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටුකිරීමට ද,

පෝතක බාලදක්ෂ නීතියට කීකරු වීමට ද,

දිනපතා යහපත් වැඩක් කිරීමට ද,

මාගේ සම්පූර්ණ උත්සාහය යෙදීමට පොරොන්දු වෙමි.

## පෝතක බාලදක්ෂ නීති

01 පෝතක බාලදක්ෂයා ආකේලාට කීකරු වෙයි.

02 පෝතක බාලදක්ෂයා ප්‍රයෝජනවත් අයෙක් වෙයි.

03 පෝතක බාලදක්ෂයා වඩාත් හොඳින් කිරීමට යත්න දරයි.

65/9,Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02.
Tel : 0115731050 / 0115876021
e-mail :slscout1@yahoo.com / srilankascout@ymail.com
Web : www.scout.lk